# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ ලිඛිත පරීක්ෂණය

### ප්‍රශ්න පත්‍රය (කාලය පැය 01 යි)



මෙම ප්‍රශ්න පත්‍රයේ කිසිවක් නොලියන්න. දී ඇති පිළිතුරු පත්‍රයේ **පමණක්** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට ඉදිරියෙන් දක්වා ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරාගෙන එම පිළිතුරේ අංකය පිළිතුරු පත්‍රයේ ඇති අදාළ ප්‍රශ්න අංකයට ඉදිරියෙන් ලියන්න.

උදාහරණ :-

01. සලකුණේ දැක්වෙනුයේ,



1. ඉදිරියෙන් පාර වසා ඇත.
2. මාර්ගය අවසානය ඉදිරියේ ඇති බවයි
3. 'ටී' හැඩයේ මංසන්ධිය ඉදිරියෙ ඇති බවයි
4. ඉදිරියේ ප්‍රධාන මාර්ගයක් ඇති බවයි

පිළිතුර ප්‍රශ්න
අංකය : 1. ....3......

1. මෙම සලකුණෙන් දැක්වෙන්නේ




1. ඉදිරියෙන් හතරමං හන්දියක් ඇති බවකි.
2. අනිවාර්ය වට රවුමක් ඇති බව
3. ඉදිරියෙන් වට රවුමක් ඇති බව
4. අනිවාර්ය වට රවුම ඉදිරියෙන් ඇති බවයි.

02. මෙම සංඥාවෙන් දැනුම් දෙන්නේ




1. එම ප්‍රදේශය තුළ පැදවිය හැකි උපරිම වේගය බවයි
2. එම ප්‍රදේශය තුළ පැදවිය හැකි සාමාන්‍ය වේගය බවයි
3. සඳහන් වේග සීමාවේ අවසානය බවයි
4. නාගරික ප්‍රදේශයට ඇතුල්වන බවයි

03. මෙම සංඥාව




1. අනතුරු හැඟවීමේ සංඥාවකි
2. පාලන සංඥාවකි
3. තොරතුරු සංඥාවකි
4. තහනම් සංඥාවකි

04. මෙම සලකුණෙන් දැක්වෙන්නේ




1. ඉදිරියෙන් වමට හැරවිය යුතු බවයි
2. දකුණට වංගුව ඉදිරියෙන් බවයි
3. වමට හැරවිය යුතු බවයි
5. වමට වංගුව ඉදිරියෙන් බවයි

05. මෙම සලකුණෙන් දැක්වෙන්නේ



1. ඉදිරියෙන් මාර්ගය පටු බවයි
2. පළල් වාහන ගමන් කිරීම තහනම් බවයි
3. පටු පාලමක් ඉදිරියෙන් බවයි
4. ද්විත්ව මාර්ගය ඉදිරියෙන් බවයි

06. මෙම සලකුණෙන් දැක්වෙන්නේ




1. ඉදිරියෙන් ප්‍රධාන මාර්ගය ඇති බවයි
2. වම් පැත්තෙන් එන වාහන වලට ප්‍රමුඛත්වය දෙන ලෙස දැනුම් දීමකි
3. U හැඩයේ මංසංධියක් ඉදිරියෙන් බවයි
4. වම් පැත්තෙන් එන රථ වාහන ප්‍රධාන මාර්ගයට එක් වන සන්ධිය ඉදිරියෙන් බවයි

07. මෙම සලකුණෙන් දැක්වෙන්නේ




1. දකුණු පැත්තට වැලමිට වංගුව ඉදිරියෙන් බවයි
2. ඉදිරියෙන් U හැඩයට හැරවීමට හැකි බවයි
3. වම්පැත්තට වැලමිට වංගුව ඉදිරියෙන් බවයි
4. ඉදිරියෙන් U හැඩයට හැරවීමට හැකි බවයි

08. මෙම සලකුණෙන් දැක්වෙන්නේ



1. පදිකයන් මාරුවන ස්ථානයකි
2. පදිකයන් මාරුවන ස්ථානය ඉදිරියෙන් බවයි
3. වාහන නවතා පාර මාරුවීමට ඉඩ දෙන ස්ථානයකි
4. පාසැල් ළමුන් මාරුවන ස්ථානය ඉදිරියෙන් බවයි

09. මෙම සලකුණෙන් දැක්වෙන්නේ



1. හතර මං හංදියක් ඉදිරියෙන් බවයි
2. අනිවාර්ය වට රවුම බවයි
3. පාර වසා ඇති බවයි
4. වට රවුම ඉදිරියෙන් බවයි

10. මෙම සලකුණෙන් දැක්වෙන්නේ



1. වාහන නැවැත්වීම තහනම් නමුත් බඩු පැටවීම තහනම් නැති බවයි
2. වාහන නැවැත්වීම සම්පූර්ණයෙන් තහනම් බවයි
3. ඔත්තේ දැන වල වාහන නැවැත්වීම තහනම් බවයි
4. වාහන නැවැත්වීම සම්පූර්ණයෙන් තහනම් බවයි

11. වාහනයක් ඉස්සර කිරීමේදී අනුගමනය කළ යුත්තේ


1. 3, 4 වැනි වැඩි ගියරයක් තෝරා ගැනීම මගින් වැඩි වේගයක් ලබාදීම
2. 1, 2 වැනි අඩු ගියරයක් තෝරා ගැනීම මගින් වැඩි බලයක් ලබාදීම
3. 1, 2 වැනි අඩු ගියරක් තෝරා ගැනීම මගින් අඩු බලයක් ලබාදීම
4. 3, 4 වැනි වැඩි ගියරක් තෝරා ගැනීම මගින් වැඩි බලයක් ලබාදීම

12. මෙම සලකුණෙන් පෙන්වා ඇත්තේ




1. ත්‍රිකෝණාකාර මංසන්ධිය ඉදිරියෙන් ඇති බවයි
2. ඉදිරියෙන් ඉඩ දෙනු යන අදහසයි
3. මාර්ගය ඉඩ දෙනු යන අදහසයි
4. ප්‍රධාන පාර ඉදිරියෙන් ඇති බවයි

13. මෙම සලකුණෙන් දැක්වෙන්නේ



1. ඉදිරියෙන් ඉඩ දෙනු යන අදහසයි
2. ප්‍රමුඛතා මාර්ගය බවයි
3. ප්‍රමුඛතා මාර්ගයේ අවසානය බවයි
4. වාහන ඇතුල්වීම සීමා කර ඇති බවයි

14. මෙම සලකුණෙන් දැක්වෙන්නේ




1. රෝහලක් ඉදිරියෙන් ඇතිබවයි
2. උසාවිය ආසන්නයේ ඇති බවයි
3. නලා ශබ්ද කිරීම තහනම් බවයි
4. පාසලක් ඉදිරියෙන් ඇති බවයි

15. මෙම සලකුණෙන් දැක්වෙන්නේ



1. ද්විත්ව මාර්ගය අවසානය බවයි
2. ඔත්තේ දිනවල වාහන නැවැත්වීම තහනම් බවයි
3. ඉරට්ටේ දිනවල වාහන නැවැත්වීම තහනම් බවයි
4. ඉස්සර කිරීම තහනම් බවයි

16. මෙම සලකුණෙන් දැක්වෙන්නේ



1. ඉදිරියෙන් එන වාහන වලට ප්‍රමුඛතාවය දියයුතු බවයි
2. ඉදිරියට යන වාහන වලට ප්‍රමුඛත්වය දිය යුතු බවයි
3. ඉදිරියෙන් පැමිණෙන වාහනයෙන් ප්‍රවේශම් වන්න යන අදහසයි
4. ඉදිරියෙන් ප්‍රධාන මාර්ගයට ඇතුලුවන බවයි

17. මෙම සලකුණෙන් දැක්වෙන්නේ




1. දුම්රියෙන් ප්‍රවේශම් විය යුතු බවයි
2. ආරක්ෂා කර නොමැති දුම්රිය හරස් මාර්ගයක් බවයි
3. ආරක්ෂා කර නොමැති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙන් බවයි
4. දුම්රිය ඉදිරියෙන් පැමිණිය හැකි බැවින් ප්‍රවේශම් වන්න යන්නයි

18. මෙම සලකුණෙන් දැක්වෙන්නේ



1. වැලමිට වංගුව ඉදිරියෙන් ඇති බවයි
2. U හැඩයට සිටින සේ හැරවීම තහනම් යන අදහසයි
3. දකුණු පැත්තට හැරවීම තහනම් යන අදහසයි
4. ඉදිරියෙන් මාර්ගය අවසානය බවයි

19. මෙම සලකුණෙන් දක්වා ඇත්තේ



1. මාර්ගය ඉදිරියෙන් පටු බවයි
2. මාර්ග දෙකක් එක් වන ස්ථානය ඉදිරියෙන් ඇති බවයි
3. ද්ත්ව රථ මාර්ගයේ අවසානය ඉදිරියෙන් බවයි
4. U හැඩයේ මංසන්ධිය ඉදිරියෙන් ඇති බවයි

20. මෙම සලකුණෙන් දැක්වෙන්නේ




1. විදුලි ආලෝක සංඥාව යන අදහසයි
2. නවතිනු යන අදහසයි
3. ඉඩ දෙනු යන අදහසයි
4. වට රවුම ඉදිරියෙන් ඇති බවයි

21. වාහනය මහා මාර්ගයේ පදවාගෙන යන ඔබ මගීන් මාරුවන ස්ථානයක් ඉදිරියෙන් ඇති බවට මාර්ග සංඥාවක් දුට විගසම

1. ඉක්මනින් මගීන් පැමිණීමට පෙර මගීන් මාරුවන ස්ථානය පසු කර යාම සඳහා වේගය වැඩි කල යුතුයි.
2. වාහනය නතර කර ගැනීමට බලාපොරොත්තුවෙන් වේගය පාලනය කර ධාවනය කළ යුතුයි.
3. නලාව ශබ්ද කර තමා එන බව මගීන්ට දන්වා නොනවත්වාම යා යුතුයි
4. මහා මාර්ගයේ මගී තදබදයක් නොමැති නම් තමාට රිසි සේ ධාවනය කළ හැක

22. ඉදිරියෙන් යන වාහනය ඉස්සර කිරීමට ඔබට අවශ්‍ය නම්

1. ඉදිරි මාර්ගය පැහැදිලිව පෙනෙන්නේ දැයි පරීක්‍ෂා කළ යුතුයි
2. මහා මාර්ගය ඉඩ තිබෙන ස්ථානයක් දැයි පරීක්‍ෂා කළ යුතුයි
3. මහා මාර්ගය හොඳින් නිරීක්‍ෂණය කර ඉස්සර කිරීමට හැකිදැයි පරීක්‍ෂා කර තීරණය කළ යුතුයි
4. ඉදිරි වාහනයේ රියදුරු ඉස්සර කිරීමට සංඥා කළ විට එය කිරීම අවශ්‍ය නැත

23. ඔබ ඉදිරියේදී දකුණට හැරවිය යුතු නම් ගමන් කළ යුත්තේ

1. මාර්ගයේ වම් පස තීරුවේය
2. දකුණු පැත්තට ගෙන යා යුතුයි
3. මාර්ගයේ මධ්‍ය රේඛාවට ආසන්නම ධාවන තීරුවේය
4. තමා කැමති මං තීරුවක් භාවිතා කළ හැක

24. ඔබ ඉදිරියේදී වම් පැත්තේ නතර කළ යුතු බව දන්නේ නම් වාහනය ගමන් කර විය යුත්තේ

1. මං තීරු භාවිතා කිරීමට අවශ්‍ය නැත
2. මාර්ගයේ මැද තීරුවේය
3. මාර්ගයේ දකුණු පැත්තේය
4. මාර්ගයේ වම් පස තීරුවේය

25. අතුරු මාර්ගයකින් ප්‍රධාන මාර්ගයට ඔබ පිවිසෙන විට

1. දකුණු පැත්ත බලා වාහන නොමැති නම් මාර්ගයට ගැනීම සුදුසුය
2. වම් පැත්ත බලා වාහන නොමැති නම් මාර්ගයට ගැනීම සුදුසුය
3. මාර්ගයේ දෙපසම සාර්ථකව නිරීක්‍ෂණය කිරීමෙන් පසු මාර්ගයට ගැනීම සුදුසුයි
4. ප්‍රධාන පාරේ වාහන තදබදයක් නොමැති නම් වමෙන් ඇතුලු විය හැක

26. ඔබට පසු පසින් පැමිණෙන වාහනයට ඔබව ඉස්සර කිරීමට අවශ්‍ය බව හැඟී ගියහොත් ඔබ විසින් කළ යුතු වන්නේ

1. වාහනයේ වේගය අඩු කර වම් පසින් ධාවනය කර ඉස්සර කිරීමට ඉඩදීමයි
2. වම්පස සිග්නල් ලාම්පු දල්වා ඔහුට යන ලෙස දැන්වීමය
3. වාහනය තවත් පාර මැදට ගෙන ඔහුට ඉස්සර වීමට ඉඩ නොදී ගමන් කිරීමයි
4. පසු පසින් එන වාහනය ගැන සැලකිලිමත් වීම අවශ්‍ය නැත

27. ඔබ වාහනය පදවාගෙන යන අවස්ථාවකදී ඔබගේ ජංගම දුරකතනය නාද වූවහොත්

1. එක් අතකින් සුක්කානම හසුරුවාගෙන අනිත් අතින් දුරකතනය ගෙන ප්‍රතිචාර දැක්විය යුතුය
2. දුරකතනයට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය නම් වාහනය අයින් කර නවතා තබා දුරකතනයට ප්‍රතිචාර දැක්විය යුතය
3. ජංගම දුරකතනය රැගෙන යාම නොකළ යුතුයි
4. නාගරික ප්‍රදේශවලදී පමණක් දුරකතනය ගෙන ප්‍රතිචාර දැක්විය නොහැක

28. ඔබ වාහනය පදවාගෙන යන අවස්ථාවකදී මාර්ගයේ ඉදිරියේ බාධකයක් නිසා වාහන පේලියක් එක් වාහනයක් පිටුපස එක් එක් වාහන නතර කර තිබෙන විට ඔබ විසින් කළ යුත්තේ

1. සියලුම වාහන ඉස්සර කර ගෙන ගොස් බාධකය ඇති තැනට පිවිසීමයි
2. මාර්ගයේ නතර වී ඇති අවසාන වාහනයට පසු පසින් නතර කර සිටීමයි
3. නලාව ශබ්ද කර තමාට ඉක්මනින් යා යුතු බව දැන්වීමයි
4. විරුද්ධ දිශාවෙන් වාහන නොමැති නම් මාර්ගයේ දකුණු පැත්තෙන් ගමන් කළ හැක

29. වාහනයක් ධාවනයේදී මීටර් පුවරුවේ රතු බල්පයක් දැල්වේ නම්

1. වාහනය ගමනාන්තය දක්වා ප්‍රවේශමෙන් ධාවනය කිරීම සුදුසුය
2. විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය නොවේ
3. වාහනය වහාම නතර කර දෝෂය කුමක් දැයි තහවුරු කරගත යුතුය
4. ආසන්නයේ ඇති ගරාජයට ධාවනය කල යුතුය

30. මහාමාර්ගයේ ධාවනය කිරීමට සුදුසු වාහනයක් යනු

1. වලංගු ආදායම් බලපත්‍රය හා රක්ෂණ සහතිකය පමණක් තිබිය යුතුය
2. සුක්කානම, තිරිංග හා ටයර් පමණක් මනා තත්වයෙන් යුතුය
3. රියදුරුට පාලනය කර ගත හැකි නම් කුමන වාහනයක් වුවද ධාවනය කළ හැකිය
4. එහි සියලුම අංග මනා කාර්මික තත්වයෙන් යුතු බව, රක්ෂණ සහතිකය ආදායම් බලපත්‍රය සමග අවශ්‍ය ලේඛන තිබිය යුතුය.

31. ආලෝක සංඥා මගින් පාලනය වන මංසන්ධි කොටුව සලකුණු කර ඇත්තේ

1. මංසන්ධියෙන් දකුණට හැරවීම හැර ඕනෑම අවස්ථාවක ඇතුලු වීමට
2. මංසන්ධිය කෙරෙහි අවධානය වැඩි කිරීමට
3. කොළ පැහැති ආලෝකය දැල්වූවත් මංසන්ධි කොටුවෙන් පිටවීමට නොහැකි නම් දකුණට හරවන වාහන හැර අනිත් කිසිදු වාහනයක් ඇතුලු නොකිරීමට
4. මංසන්ධියක් නිතරම වාහන තදබද ඇතිබව දැන්වීමට

32. ස්වයංක්‍රීය ගියර නොවන වාහනයක් තැනිතලා බිමක ගමන් ආරම්භක ක්‍රියාවලියේ අවසාන මොහොතේදී දෙපා තිබිය යුතු අයුරු

1. දකුණු පාදය බිම තහඩුවේ සහ වම් පාදය ක්ලච් පෙඩලයේ
2. දකුණු පාදය ඇක්සලරේටරයේ සහ වම් පාදය ක්ලච් පෙඩලයේ
3. දකුණු පාදය තිරිංග පෙඩලයේ සහ වම් පාදය ක්ලච් පෙඩලයේ
4. දකුණු පාදය තිරිංග පෙඩලයේ හා වම් පාදය බිම් තහඩුවේ

33. පහලට බෑවුමකදී පිටුපසට පදවන ස්වයංක්‍රීය ගියර් නොවන වාහනයකදී දෙපා තිබිය යුතු අයුරු

1. දකුණු පාදය බිම් තහඩුවේ සහ වම් පාදය ක්ලච් පෙඩලයේ
2. දකුණු පාදය තිරිංග පෙඩලයේ සහ වම් පාදය බිම් තහඩුවේ
3. වම් පාදය ක්ලච් පෙඩලයේ යාන්තමට සහ දකුණු පාදය ඇක්සලරේටරයේ
4. වම් පාදය ක්ලච් පෙඩලයේ සහ දකුණු පාදය තිරිංග පෙඩලයේ

34. ස්වයංක්‍රීය ගියර් නොවන වාහනයක් සාමාන්‍ය තැනිතලා නිදහස් මාර්ගයේ ධාවනයේදී දෙපා තිබිය යුතු අයුරු

1. වම් පාදය බිම් තහඩුවේ සහ දකුණු පාදය ඇක්සලරේටරයේ
2. වම් පාදය ක්ලච් පෙඩලයේ යාන්තමට සහ දකුණු පාදය ඇක්සලරේටරයේ
3. වම් පාදය තිරිංග පෙඩලයේ යාන්තමට සහ දකුණු පාදය ඇක්සලරේටරයේ
4. වම් පාදය ක්ලච් පැඩලයේ හා දකුණු පාදය තිරිංග පැඩලයේ

35. ස්වයංක්‍රීය ගියර නොවන වාහනයක් මාර්ග තදබදය ඇති අවස්ථාවක ධාවනයේදී දෙපා තිබිය යුතු අයුරු

1. වම් පාදය ක්ලච් පෙඩලයේ සහ දකුණු පාදය තිරිංග පෙඩලයේ යාන්තමට
2. වම් පාදය බිම් තහඩුවේ සහ දකුණු පාදය ඇක්සලරේටරයේ
3. වම් පාදය ක්ලච් පෙඩලයේ යාන්තමට සහ දකුණු පාදය ඇක්සලරේටරයේ
4. වම් පාදය බිම් තහඩුවේ සහ දකුණු පාදය තිරිංග පෙඩලයේ

36. වාහනයක් පසුකර යෑමේදී නිවැරදි ක්‍රියාමාර්ග වනුයේ

1. සංඥා යොදා මාර්ගය හොඳින් නිරීක්ෂණය කර වාහනය නිවැරදිව පාලනය කිරීමය
2. වාහනයේ වේගය වැඩි කර සංඥා යොදා මාර්ගය හොඳින් නිරීක්ෂණය කර වාහනය නිවැරදිව පාලනය කිරීමය
3. මාර්ගය හොඳින් නිරීක්ෂණය කර සංඥා යොදා වාහනය නිවැරදිව පාලනය කිරීමය
4. වාහනයේ වේගය අනුව ක්‍රියාවලිය වෙනස්වේ.

37. මෝටර් වාහනයකට ඉන්ධන පිරවීමේදී,

1. වාහනයේ එන්ජිම පණ ගන්වා තිබියදී ඉන්ධන පිරවිය යුතුයි
2. ඉන්ධන පුරවන අවස්ථාවේ එන්ජිම නවතා තැබිය යුතුයි
3. එන්ජිමේ තෙල් නියමිත ප්‍රමාණයට ඇත්දැයි අනිවාර්යයෙන් පරීක්‍ෂා කළ යුතුයි
4. වාහනයේ එන්ජිම ගැන සැලකිලිමත් වීම අවශ්‍ය නැත

38. වට රවුමක පිළි පැදිය යුතු නීතිය වන්නේ

1. වම් පසින් එන වාහන වලට ප්‍රමුඛත්වය දීමයි
2. පොලිස් නිලධාරියකු පාලනය නොකරන්නේ නම් දකුණු පසින් පැමිණෙන වාහන වලට ඉඩ දීමයි
3. ඉදිරි පසට සහ දකුණට ඉඩ දීමයි
4. වමෙන් හා දකුණෙන් එන වාහන වලට ඉඩ දීමයි

39. වෙනත් වාහනයක් ඉස්සර කිරීමේදී පළමුව කළ යුත්තේ

1. තමාගේ වේගය අඩු කිරීමය
2. කන්ණාඩියෙන් පසු පස බැලීමයි
3. වාහනය දකුණු පසට ගැනීමයි
4. වාහනයේ නලාව ශබ්ද කිරීමයි

40. රිය අනතුරක් පොලිස් ස්ථානයට වාර්ථා කිරීම සඳහා දී ඇති උපරිම කාළ සීමාව

1. පැය 12
2. පැය 24
3. පැය 36
4. පැය 48